// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1817/02 - 2013 ජූලි මස 01 වැනි සඳුදා - 2013.07.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1980 අංක 2 දරන නාගරික සංවර්ධන ව්‍යාපෘති (විශේෂ විධිවිධාන) පනත**

2 වැනි වගන්තිය යටතේ නියමය

1980 අංක 2 දරන නාගරික සංවර්ධන ව්‍යාපෘති (විශේෂ විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති මහින්ද රාජපක්ෂ වන මම, නාගරික සංවර්ධන විෂයභාර අමාත්‍යවරයාගේ නිර්දේශ මත මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති ඉඩම් කොටස බහුමහල් රථගාලක් හා වානිජ සංවර්ධන ව්‍යාපෘතියක් ආරම්භ කිරීම සඳහා වහා අවශ්‍ය වී ඇති බව මාගේ මතය වන හෙයින් එකී ඉඩම් කොටස එකී කාර්ය සඳහා අවශ්‍ය බව මෙම නියමයෙන් ප්‍රකාශයට පත් කරමි.

මහින්ද රාජපක්ෂ,
ජනාධිපති.

2013 ජූනි මස 26 වැනි දින,
ජනාධිපති ලේකම් කාර්යාලය,
කොළඹ 01.

උපලේඛනය

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ කොළඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 20 කොටුව කොළඹ මහ නගර සභාව තුළ පිහිටි මු.පි.කෙ. 5257 දරන මිනින්දෝරු සැලැස්මේ කැබලි අංක 01 මගින් දක්වා ඇති කොටුව චැතැම් වීදියේ වරිපනම් අංක 125 දරන ඉඩම.

ඉඩම් කොටස් සඳහා මායිම් පහත දැක්වේ.

කැබලි අංක 1 ප්‍රමාණය අක්කර 00 රූඩ් 02, පර්. 14.78

| | | |
|---|---|---|
| උතුරට | : | පාර ; |
| නැගෙනහිරට | : | බ්‍රිස්ටල් වීදිය ; |
| දකුණට | : | චැතැම් වීදිය ; |
| බටහිරට | : | යෝක් වීදිය. |

07 - 411

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

1A - G 017870 — 315 (2013/07)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*